සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - මාර්තු - 2

ශ්‍රේණිය - 12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය,රත්නපුර.

01. තරිඳුගේ ව්‍යාපාරයේ පහත තොරතුරු සැලකිල්ලට ගනිමින් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

(i) 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
(ii) 2018.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය
(iii) 2017.04.01 දිනට ප්‍රාග්ධනය

වත්කම් හා වගකීම් පහත දැක්වේ.

| අයිතම | රු. 2017/04/01 | රු. 2018/03/31 |
|---|---|---|
| පරිගණක | 140 000 | 220 000 |
| ලී බඩු | 60 000 | 48 000 |
| භාණ්ඩ තොග | 35 000 | 42 000 |
| ණය ගැතියෝ | 38 000 | 46 000 |
| මුදල් (බැංකු) | 4 000 | ? |
| උපචිත වියදම් | 5 000 | 7 500 |
| ණය හිමියෝ | 23 000 | 19 000 |
| බැංකු ණය | - | 100 000 |

අතිරේක තොරතුරු

1. වර්ෂය තුළ රු. 100 000 ක් වටිනා පරිගණකයක් මිලට ගෙන ඇත.
2. වර්ෂය තුළ රු. 8000 ක් වටිනා ලී බඩු රු. 10 000 කට විකුණා ඇත.
3. වර්ෂය තුළ මෙහෙයුම් වියදම් රු. 12 000 ක් මුදලින් ගෙවා ඇත.
4. වර්ෂය තුළ ණයගැතියන්ගෙන් රු. 257 000 ක් මුදල් ලැබී ඇත. ඔවුන්ට රු. 3000 ක් වට්ටමක් ලබා දී ඇත.
5. වර්ෂය තුළ ණය හිමියන්ට මුදල් ගෙවීමේදී රු. 8000 ක වට්ටමක් ලැබී ඇත.
6. බැංකු ණය ලබාගෙන ඇත්තේ 2016.12.31 දිනය ඒ සඳහා 12% ක වාර්ෂික පොලියක් අය කරයි.
7. තරිඳු විසින් මෙම වර්ෂයේ රු. 5000 ක භාණ්ඩ සහ මුදලින් රු. 10 000 ක් පුද්ගලික ආයෝජනයට ගෙන ඇත.
8. මෙම ව්‍යාපාරය පිරිවැයට $33\frac{1}{3}$ % ක් ලාභ තබාගෙන භාණ්ඩ විකුණයි.